31901

AL/2019/23/S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.16 / 1400 - 1600

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A** සහ **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විතය.
* **A** කොටස බහුවරණ ප්‍රශ්න **30** කින් සහ **B** කොටස කෙටි ප්‍රශ්න **20** කින් යුක්ත වේ.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් පිළිතුරකට ලකුණු **දෙක** බැගින් ලකුණු **100** කි.

## A කොටස

● අංක **1** සිට **20** තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත්** ගැළපෙන පිළිතුර තෝරන්න.

**1.** දේශපාලනය,
(1) රාජ්‍යය සහ ජනතාව අතර පවතින සම්බන්ධතා ක්ෂේත්‍රයකි.
(2) ආණ්ඩුවේ කටයුතුවලට පමණක් සීමා වී තිබේ.
(3) යනු රාජ්‍යය සහ ආණ්ඩුව පිළිබඳ අධ්‍යයනයයි.
(4) රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට පමණක් සීමා වී තිබේ.
(5) ආධ්‍යාත්මික ජීවිතය කළමනාකරණය පිළිබඳ ව සැලකිලිමත් වේ. (……)

**2.** දේශපාලනය අධ්‍යයනය කිරීම,
(1) සැමවිට ම ප්‍රතිමානීය විමර්ශනයට සීමා වී ඇත.
(2) බල අරගලය හැදෑරීමට පමණක් සීමා වී ඇත.
(3) විද්‍යාත්මක විමර්ශනය පමණක් ලක්ෂණ කොට ගෙන ඇත.
(4) ස්වාභාවික විද්‍යාවන්ගේ මට්ටමට මුහුකුරා ගොස් තිබේ.
(5) විද්‍යාත්මක සහ ප්‍රතිමානීය සලකා බැලීම් දෙකෙන් සමන්විත ය. (……)

**3.** ආණ්ඩුව,
(1) වෙනස් කළ නොහැකි ආයතනයකි.
(2) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමවල දී මහජනතාවගේ එකම නියෝජිතයා ය.
(3) රාජ්‍යයේ මූලිකාංගයකි.
(4) රාජ්‍යය යන්නට සමාන පදයකි.
(5) රාජ්‍යයට වඩා බලවත් ය. (……)

**4.** ස්ත්‍රීවාදය,
(1) ගැහැනු ළමයින් සඳහා වෙන් වූ පාසල් තිබිය යුතු යැයි යෝජනා කරයි.
(2) සමානාත්මතාව නොතකා හරියි.
(3) ග්‍රීක යුගයේ ආරම්භ වූ මතවාදයකි.
(4) ස්ත්‍රීන් අත්විඳින, වෙනස්කොට සැලකීම් අවසන් කිරීම අපේක්ෂා කරයි.
(5) පවුලේ සුබසාධනයේ වැදගත්කම හුවා දක්වයි. (……)

**5.** ස්වාධිපත්‍යය,
(1) විශාල සහ කුඩා රාජ්‍ය අතර පවතින අසමානතා පිළිගනියි.
(2) රාජ්‍යයේ උත්තරීතර බලය සංකේතවත් කරයි.
(3) ගෝලීයකරණය නිසා අභියෝගයට ලක් වී නැත.
(4) අවශ්‍ය වූ විටෙක පහසුවෙන් බෙදිය හැකි ය.
(5) රාජ්‍යත්වය සඳහා අවශ්‍ය කොන්දේසියක් නො වේ. (……)

[දෙවැනි පිටුව බලන්න.

tamilguru.lk

**6.** ඒකීය ආණ්ඩුක්‍රම ආකෘතියෙහි දී,
(1) ස්වාධිපත්‍යය බෙදා නොගනියි.
(2) ස්වාධිපත්‍යය ප්‍රාන්ත ආණ්ඩු සමග බෙදා ගැනේ.
(3) ව්‍යවස්ථාදායකයේ දෙවැනි මණ්ඩලයක් තිබීම අත්‍යවශ්‍ය ලක්ෂණයකි.
(4) මධ්‍යම ආණ්ඩුව සහ පළාත් පාලන ආයතන අතර ගැටුම් ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විසඳනු ලබයි.
(5) පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථා සම්පාදක බලය සීමිත ය. (……)

**7.** සහසංධීය ආණ්ඩුක්‍රමය
(1) ස්වාධීන රාජ්‍යයන් අතර ස්වේච්ඡා ගිවිසුමක් මත පදනම් ව නොමැත.
(2) අනෙක් ආණ්ඩුක්‍රම මාදිලිවලට වඩා කාර්යක්ෂම ය.
(3) ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් සහිත ය.
(4) වර්තමාන ව්‍යවස්ථාවට පෙර ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවතිණි.
(5) තනි නීති ක්‍රමයක් සහිත ය. (……)

**8.** රාජ්‍ය ප්‍රතිපත්තිය
(1) මහජන දුක් ගැනවිලි නිරාකරණය පිළිබඳ සැලකිලිමත් නොවේ.
(2) නිලබල තන්ත්‍රයට වැදගත් භූමිකාවක් නොපවරයි.
(3) රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාව ප්‍රවර්ධනය නොකරයි.
(4) මහජන ගැටලු විසඳීමේ මූලෝපාය තීරණය කරයි.
(5) දේශපාලන පක්ෂවල බලපෑමෙන් සපුරා නිදහස් ය. (……)

**9.** ජනාධිපති ආණ්ඩුක්‍රම ආකෘතිය,
(1) විධායකය සහ ව්‍යවස්ථාදායකය සඳහා වෙන් වෙන් මැතිවරණවලට අවකාශ සලසයි.
(2) විධායක සහ ව්‍යවස්ථාදායක බලතල ඒකාබද්ධවීමට ඉඩ සලසයි.
(3) ජනාධිපතිවරයා සලකනු ලබන්නේ විධායකයේ නාමික ප්‍රධානියා ලෙස ය.
(4) ජනාධිපතිවරයා ව්‍යවස්ථාදායකයට වග උත්තර කීමට සලස්වයි.
(5) ජනාධිපතිවරයාට ව්‍යවස්ථාදායකය අභිබවා යාමට හැකියාව ලබා දෙයි. (……)

**10.** ගැටුම් සම්බන්ධව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ගැටුම් සැමවිට ම නිෂේධනීය ප්‍රතිඵල ඇති කරයි.
(2) ගැටුම් පැන නගින්නේ පාර්ශ්වකරුවන් අතර සමනය කළ නොහැකි අරමුණු නිසා ය.
(3) ගැටුම් සමාජ ජීවිතයට අදාළ නොවේ.
(4) ප්‍රචණ්ඩ ගැටුම් සහමන්ත්‍රණය මගින් පරිවර්තනය කිරීම දුෂ්කර ය.
(5) ගැටුම් සමාජය වෙනස් කිරීමට දායක නො වේ. (……)

**11.** ජාත්‍යන්තර දේශපාලනයේ ප්‍රධාන ක්‍රියාධරයන් වන්නේ,
(1) ජාත්‍යන්තර මූල්‍ය සහ සංස්කෘතික සංවිධාන ය.
(2) බහුජාතික සමාගම් සහ රාජ්‍ය නො වන සංවිධාන ය.
(3) රාජ්‍ය ක්‍රියාධරයන් සහ රාජ්‍ය නො වන ක්‍රියාධරයන් ය.
(4) දේශපාලන පක්ෂ සහ ප්‍රභූ කණ්ඩායම් ය.
(5) ජාත්‍යන්තර රාජ්‍ය නො වන සංවිධාන සහ සමාජ ව්‍යාපාර ය. (……)

**12.** සමාජවාදී මතවාදය,
(1) රාජ්‍යයේ පැවැත්ම සියලු ම සමාජ ක්‍රමවලට අවශ්‍යයැ'යි සලකයි.
(2) පෞද්ගලික දේපළ අයිතිය පිළිගනියි.
(3) ධනවාදී ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමට අපේක්ෂා කරයි.
(4) සමාජ ජීවිතය තුළ ආගමට ඇති වැදගත්කම අවධාරණය කරයි.
(5) පන්ති විරහිත සමාජ ක්‍රමයක අවශ්‍යතාව අවධාරණය කරයි. (……)

**13.** නූතන විදේශ ප්‍රතිපත්තියේ සුජාත මාධ්‍යයක් **නො වන්නේ** මෙයින් කුමක් ද?
(1) රාජ්‍ය තාන්ත්‍රික සේවාව
(2) විදේශාධාර
(3) හමුදා මූලෝපාය
(4) සංස්කෘතික සබඳතා
(5) ආගම්වලට හරවා ගැනීම (……)

More Past Papers at
tamilguru.lk

[තුන්වැනි පිටුව බලන්න.

**14.** ඉන්දියානු සංධීය ක්‍රමයට අදාළ **නොවන** ප්‍රකාශයක් වන්නේ මින් කුමක් ද?
(1) මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්ත බිහිකොට ඒවායේ නම් වෙනස් කළ හැකි ය.
(2) මධ්‍යම ආණ්ඩුවට හදිසි අවස්ථාවල දී ඒකීය ආණ්ඩුක්‍රමයක මෙන් ක්‍රියා කළ හැකි ය.
(3) මධ්‍යම ආණ්ඩුවට ප්‍රාන්තවල ව්‍යවස්ථාදායක හා විධායක බලය සීමා කිරීමට හැකි ය.
(4) ඉන්දියානු සංධීය ක්‍රමය, ඇමෙරිකා එක්සත් ජනපදයේ සංධීය ක්‍රමයට සමාන ය.
(5) ව්‍යවස්ථාවේ ඒකීය මෙන් ම සංධීය ලක්ෂණ ද තිබේ. (……)

**15.** ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) සර්වජන ඡන්ද බලය මගින් සාමාන්‍ය ජනයා සවිබල ගැන්වී ය.
(2) සුබසාධන රාජ්‍යය සඳහා පදනම දැමී ය.
(3) ස්වදේශීය දේශපාලනඥයින් වගකීම් සහගත ආණ්ඩුවක් සඳහා යොමු කළේ ය.
(4) දේශපාලනඥයින් සාමාන්‍ය ජනයා මත රඳා පැවැතීමට මග පෑදී ය.
(5) අමාත්‍ය මණ්ඩලයේ සාමූහික වගකීම පිළිබඳ මූලධර්මය හඳුන්වා දුන්නේ ය. (……)

**16.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) ලිබරල්වාදීහු රාජ්‍යය සමාජයේ අපක්ෂපාත බේරුම්කරු ලෙස දකිති.
(2) ස්ත්‍රීවාදීහු රාජ්‍යය, පුරුෂාධිපත්‍ය ආයතනයක් ලෙස සලකති.
(3) ෆැසිස්ට්වාදීහු රාජ්‍යය, සමාජයට වඩා පහත් යැයි සලකති.
(4) සමාජ ප්‍රජාතන්ත්‍රවාදීහු රාජ්‍යය, පොදු යහපත මූර්තිමත් කරන්නේ යැයි සලකති.
(5) මාක්ස්වාදීහු රාජ්‍යය, පාලක පන්තියේ මෙවලමක් ලෙස සලකති. (……)

**17.** ඇමෙරිකා එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මාදිලිය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) ශ්‍රේෂ්ඨාධිකරණය මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩු අතර ඇති වන ආරවුල් නිරාකරණය කරයි.
(2) සෑම ප්‍රාන්තයක්ම සමාන බලතල භුක්ති නොවිඳියි.
(3) ශේෂ බලතල පවරා තිබෙන්නේ ප්‍රාන්තවලට ය.
(4) අධිකරණ තීන්දුවලින් මධ්‍යම ආණ්ඩුවේ බලයේ වපසරිය පුළුල් කර තිබේ.
(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීමට ප්‍රාන්තවල අනුමැතිය අවශ්‍ය වේ. (……)

**18.** කෝල්බෲක්-කැමරන් කොමිසම ඉදිරිපත් කරන ලද නිර්දේශ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) යැපුම් ආර්ථිකය සංරක්ෂණය කිරීම
(2) සාම්ප්‍රදායික සමාජ භාවිත වෙනස් නොකිරීම
(3) ස්වාධීන අධිකරණයක් ස්ථාපිත කිරීම
(4) යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වැඩවසම් ක්‍රමය භාවිත කිරීම
(5) ආණ්ඩුකාරයාගේ බලය වැඩි කිරීම (……)

**19.** 1972 ජනරජ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) එය ජනතා පරමාධිපත්‍යය පිළිබඳ සංකල්පය මත පදනම් විය.
(2) එය බලතල වෙන් කිරීමේ මූලධර්මය හඳුන්වා දුන්නේ ය.
(3) එය මූලික අයිතිවාසිකම් කඩ වීම සම්බන්ධයෙන් නෛතික ප්‍රතිකර්ම හඳුන්වා දුන්නේ ය.
(4) එය භාෂා අයිතිවාසිකම් හඳුන්වා දුන්නේ ය.
(5) එය ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටුවීය. (……)

**20.** 'නීතියේ ආධිපත්‍යය' යන සංකල්පයට අදාළ ප්‍රකාශය තෝරන්න.
(1) අත්තනෝමතික පාලනය වැළැක්වීම අරමුණු කරයි.
(2) පාලකයින්ට අභිමතානුසාරී බලය භාවිත කිරීමට ඉඩ සලසා දෙයි.
(3) පාලකයින්ට නෛතික මුක්තිය සහතික කරයි.
(4) අතීතයට බලපාන නීතිවල වලංගුභාවය පිළිගනියි.
(5) පුද්ගල අයිතිවාසිකම් සීමා කරයි. (……)

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරන්න.

**21.** ලිබරල් මතවාදය,

A – පුද්ගල නිදහස පිළිබඳ අදහස අවධාරණය කරයි.
B – ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් නිදහස සීමා කරයි.
C – යුරෝපයේ වැඩවසම් ක්‍රමයේ බිඳ වැටීමෙන් පසු පැන නැඟිණි.
D – සීමිත ආණ්ඩුවක අවශ්‍යතාව පිළිගනියි.
E – නිදහස් වෙළෙඳපොළ ආර්ථිකයට විරුද්ධ වෙයි.

(1) ABCE (2) ABD (3) ACD (4) BCD (5) BCDE (……)

**22.** සිවිල් සමාජය,

A – රාජ්‍යයෙන් පරිබාහිරව පවතින සමාජීය පරිමණ්ඩලයකි.
B – ස්වේච්ඡා සංවිධාන ඇතුළත් වන ක්ෂේත්‍රයකි.
C – ප්‍රතිපත්ති උපදේශනයේ නියුතු වෙයි.
D – පුරවැසියන් සවිබල ගන්වයි.
E – නිර්දේශපාලනික පරිමණ්ඩලයකි.

(1) ABCD (2) ABDE (3) ACDE (4) BCD (5) BCDE (……)

**23.** දේශපාලන පක්ෂ,

A – ජනතාව ආණ්ඩුවෙන් ඈත් කරයි.
B – දේශපාලන තනතුරු සඳහා නායකයින් බඳවා ගනියි.
C – වැදගත් දේශපාලන කාරණා සම්බන්ධව ජනතාවට අධ්‍යාපනය ලබා දෙයි.
D – රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාදාමය වෙතට මහජන මතය රැගෙන යයි.
E – ආණ්ඩුකරණයේ දී ජනතාව නියෝජනය කරයි.

(1) ABCD (2) ACE (3) ADE (4) BCDE (5) BDE (……)

**24.** බලතල වෙන් කිරීම පිළිබඳ සංකල්පය,

A – ආණ්ඩුවේ බලතල සංවරණය සහ තුලනය කිරීම අවධාරණය කරයි.
B – ආණ්ඩුවේ බලය ආයතනික වශයෙන් වෙන් කිරීම අවධාරණය කරයි.
C – සාමාන්‍යයෙන් අධිකාරවාදී රාජ්‍යයන්හි භාවිතයට ගැනේ.
D – ආණ්ඩුවේ අත්තනෝමතික ක්‍රියා වැළැක්වීම අපේක්ෂා කරයි.
E – මොන්ටෙස්කියු විසින් හඳුන්වා දෙන ලදී.

(1) ABCD (2) ABDE (3) ACDE (4) BCDE (5) CDE (……)

**25.** ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩුකරණයට අදාළ ලක්ෂණ තෝරන්න.

A – ස්වාධීන අධිකරණය
B – වගවීම් සහිත ආණ්ඩුකරණය
C – නීතියේ ආධිපත්‍යය
D – සක්‍රිය සිවිල් සමාජය
E – තරගකාරී නොවන මැතිවරණ

(1) ABC (2) ABCD (3) BCD (4) BCDE (5) CDE (……)

More Past Papers at
tamilguru.lk

[පස්වැනි පිටුව බලන්න.

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැළපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4), සහ (5) යන වරණවලින් කවර වරණයදැ'යි තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **26.** | ශ්‍රී ලංකාවේ, දෙවන ජනරජ ව්‍යවස්ථාවට සිදු කළ දහනව වන සංශෝධනය යටතේ ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා පත් කරනු ලැබේ. | පාර්ලිමේන්තුවේ උපරිම විශ්වාසය ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය. | (......) |
| **27.** | 1978 ව්‍යවස්ථාවේ දහඅට වන සංශෝධනය ස්වාධීන කොමිෂන් සභා දුර්වල කළේ ය. | දහ අටවන ව්‍යවස්ථා සංශෝධනය මගින් ජනාධිපතිවරයාගේ ධූර වාර ගණන පිළිබඳ සීමා ඉවත් කෙරිණි. | (......) |
| **28.** | 1978 ව්‍යවස්ථාවේ දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා ක්‍රමය හඳුන්වා දෙනු ලැබිණි. | පළාත් සභා ක්‍රමය ඉන්දියානු සංඝීය ක්‍රමයට සෑම අතින්ම සමාන ය. | (......) |
| **29.** | දෙවන ජනරජ ව්‍යවස්ථාව ද්වි-මාණ්ඩලික ව්‍යවස්ථාදායක් සඳහා විධිවිධාන සැලසී ය. | දෙවන ජනරජ ව්‍යවස්ථාවෙහි මූලික අයිතිවාසිකම් පරිච්ඡේදය, කණ්ඩායම් අයිතිවාසිකම් පිළිගෙන තිබේ. | (......) |
| **30.** | 1978 මුල් ව්‍යවස්ථාව, පාර්ලිමේන්තු මැතිවරණ සඳහා මනාප ක්‍රමය සමග සමානුපාතික නියෝජනය හඳුන්වා දුන්නේ ය. | සමානුපාතික නියෝජන ක්‍රමය, පක්ෂ නායකත්වයේ බලය වර්ධනය කළේ ය. | (......) |

## B කොටස

**31.** සංධීය ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**32.** සංධීය ආණ්ඩුක්‍රම බිහිවන ක්‍රම දෙකක් තිබේ. එම ක්‍රම **දෙක** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**33.** ඒකීය ආණ්ඩුක්‍රමයේ වාසි **දෙකක්** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**34.** ජනාධිපති ආණ්ඩුක්‍රමයක ව්‍යවස්ථාදායකය සහ විධායකය අතර ප්‍රධාන වෙනස්කම් දෙකක් පවතී. එම වෙනස්කම් **දෙක** සඳහන් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**35.** යටත්විජිත ඇති කිරීමේ ක්‍රම දෙකක් පැවැත තිබේ. එම ක්‍රම **දෙක** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**36.** යටත්විජිත පාලකයින්ට ලංකාවේ දී ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට බලපෑ අභිප්‍රේරණ **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**37.** පහත සඳහන් තේමා යටතේ, කෝල්බෲක්-කැමරන් කොමිසම ඉදිරිපත් කළ නිර්දේශය බැගින් සඳහන් කරන්න.

(1) අධිකරණය ..........................................................................................................

(2) ආණ්ඩුකාරයාගේ බලතල ..........................................................................................................

**38.** රාජ්‍යයක විදේශ ප්‍රතිපත්තිය තීරණය වීමට බලපාන සාධක **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**39.** දේශපාලන විද්‍යා විමර්ශනයේ සාම්ප්‍රදායික ප්‍රවේශ **දෙකක්** නම් කරන්න.

(1) ..........................................................................................................

(2) ..........................................................................................................

**40.** පහත සඳහන් ප්‍රකාශනවලින් විස්තර කෙරෙන සමාජයේ ඇති දේශපාලන සංවිධාන **දෙක** නම් කරන්න.

(1) ස්වාධිපත්‍යය පිහිටා ඇති කේන්ද්‍රීය ආයතනය :– ..........................................................................................................

..........................................................................................................

(2) රාජ්‍යයේ ප්‍රධාන නියෝජිතයා :– ..........................................................................................................

[ඉත්වැනි පිටුව බලන්න.

**41.** ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල දේශපාලන පක්ෂ සතු කාර්යයන් **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**42.** නූතන ජාතික රාජ්‍යයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**43.** සමූහාණ්ඩුවාදයේ ප්‍රධාන උපකල්පන **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**44.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, පාර්ලිමේන්තුව ආයතන තුනකින් සමන්විත විය. ඒවායින් **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**45.** රාජ්‍ය ප්‍රතිපත්ති ජීවන චක්‍රයේ ඕනෑම පියවර **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**46.** රාජ්‍යයේ විකාශනය පිළිබඳ මාක්ස්වාදී න්‍යායේ ඉදිරිපත් කර ඇති ඕනෑම අවධි **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**47.** ගැටුම් පිළිබඳ දේශපාලන වර්ගීකරණයට අයත්, ගැටුම් වර්ග **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**48.** 'සීමිත ආණ්ඩුව' යන සංකල්පයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**49.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයට අනුව, පළාත් සභාවක විධායකය ආයතන දෙකකින් සමන්විත ය. එම ආයතන **දෙක** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

**50.** වෙස්ට්මින්ස්ටර් මාදිලිය අනුගමනය කළ නිදහස් ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා **දෙකක්** නම් කරන්න.

(1) ....................................................................................................

(2) ....................................................................................................

* * *

31901

AL/2019/23/S-II(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

දේශපාලන විද්‍යාව II
அரசியல் விஞ்ஞானம் II
Political Science II

23 S II

2019.08.19 / 1300 - 1610

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත ය.

※ පළමුවැනි කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද, දෙවැනි කොටසින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද, තුන්වෙනි කොටසින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** "දේශපාලනය යනු සමාජ භාවිතයකි." පැහැදිලි කරන්න. (ලකුණු 20)

**2.** "රාජ්‍යය, සමාජයේ පවත්නා දේශපාලන බලයේ කේන්ද්‍රීය ආයතනයයි." සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**3.** කැබිනට් ආණ්ඩුක්‍රමය සහ ජනාධිපති ආණ්ඩුක්‍රමය සංසන්දනය කරන්න. (ලකුණු 20)

## II කොටස

**4.** ශ්‍රී ලංකාවේ සිදු වූ යටත් විජිත පරිවර්තනයේ දේශපාලන පැතිකඩ සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**5.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම **දෙකක්** සාකච්ඡා කරන්න.
   (i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ එල්ල වූ විවේචන
   (ii) විධායකයේ බලතල සහ කාර්යයන්
   (iii) ව්‍යවස්ථාදායකයේ බලතල සහ කාර්යයන් (ලකුණු 10 × 2 = 20)

**6.** 1972 ජනරජ ව්‍යවස්ථාව යටතේ ව්‍යවස්ථාදායකය හා විධායකය අතර පැවැති සම්බන්ධතාව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

**7.** 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ අදාළ සංශෝධනවලට සම්බන්ධ පහත සඳහන් ඕනෑම මාතෘකා **දෙකක්** සාකච්ඡා කරන්න.
   (i) රාජ්‍යයේ නායකයා වශයෙන් ජනාධිපතිගේ භූමිකාව
   (ii) ව්‍යවස්ථාදායකයේ බලතල හා ඒවායේ සීමාවන්
   (iii) මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දී අධිකරණය සතු වගකීම
   (iv) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැදගත්කම සහ එයට එල්ල වී ඇති විවේචන (ලකුණු 10 × 2 = 20)

## III කොටස

**8.** ඉන්දීය සංධීය ආණ්ඩුක්‍රම මාදිලිය අර්ධ සංධීය ක්‍රමයක් යැයි විස්තර කිරීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 20)

**9.** ලෝක දේශපාලනයේ සමකාලීන ප්‍රවණතා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

**10.** පහත සඳහන් ඕනෑම **දෙකක්** පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.
   (i) ජාතිකවාදය
   (ii) නිරාගමිකවාදය
   (iii) ගැටුම් කළමනාකරණය
   (iv) "සිවිල් සමාජය" යන සංකල්පයේ අර්ථ
   (v) බලය පිළිබඳ ස්ත්‍රීවාදී දැක්ම (ලකුණු 10 × 2 = 20)

More Past Papers at
tamilguru.lk

* * *